Library Copy 2024.09

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම 2024
## බුද්ධ ධර්මය
## 10 ශ්‍රේණිය

කාලය පැය 03 යි. විභාග අංකය ..................

Learning Resource Center R Dr. Mazenod College Kandana

පොදු උපදෙස්
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ නිවැරදි පිළිතුර සඳහන් කවය තුළ (x) ලකුණ යොදන්න.

## I කොටස

1) බෝසතාණන් වහන්සේ තමාගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම හඳුන්වන්නේ,

(1) දේව ආරාධනය යනුවෙනි. (2) පංචමහා විලෝකනය යනුවෙනි.
(3) සිංහ නාද පැවැත්වීම යනුවෙනි. (4) සිංහාවලෝකනය යනුවෙනි.

2) සුප්‍රබුද්ධ රජුගේ රූමත් දූ කුමරිය වූයේ,

(1) කිසාගෝතමී කුමරියයි. (2) රූපනන්දා කුමරියයි.
(3) භද්දකච්චායනා කුමරියයි. (4) ජනපද කල්‍යාණී කුමරියයි.

3) සුද්ධෝදන රජුගේ එකම අභිලාෂය වූයේ සිය පුත් කුමරා,

(1) සක්විති රජකු වනු දැකීමයි. (2) ලොවුතුරා බුද්ධත්වයට පත්වනු දැකීමයි.
(3) මගධ රට රජු වනු දැකීමයි. (4) පැවිදි වනු දැකීමයි.

4) ලොව පැරණිම භික්ෂු සංවිධානය ආරම්භ වූයේ,

(1) කෝලිත - උපතිස්ස පැවිද්දෙනි. (2) ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්දෙනි.
(3) කෝලිය කුමාරවරුන්ගේ පැවිද්දෙනි. (4) පස්වග තවුසන්ගේ පැවිද්දෙනි.

5) මහ සඟරුවන විසින් ඉටු කරන ආගමික සේවාවන් අතරට අයත් නොවන්නේ,

(1) පිරිත් පිංකම් පැවැත්වීම. (2) බෝධි පූජා පැවැත්වීම.
(3) වෛද්‍ය සායන පැවත්වීම. (4) ආසන්න ධර්ම දේශනා පැවැත්වීම.

6) බඹරා මල නොතලා රොන් ගන්නා සේ භික්ෂූන් වහන්සේ සමාජයට බරක් නොවන ආකාරයෙන් සැදැහැවතුන්ගේ ප්‍රත්‍ය පහසුකම් ලබාගත යුතු ය. මෙහි ප්‍රත්‍ය පහසුකම් යනු,

(1) සිව්පසයයි. (2) පිරිකරයි.
(3) විහාරස්ථාන තැනීම සඳහා ඉඩකඩම්ය. (4) අධ්‍යාපන උපකරණයි.

7) රහසත් පව් නොකොට ..... යනාදී කවිය ඇතුළත් බෞද්ධ ග්‍රන්ථය වන්නේ,

(1) කාව්‍යශේඛරයයි. (2) බුදුගුණ අලංකාරයයි.
(3) ලෝවැඩ සඟරාවයි. (4) සුභාෂිතයයි.

8) තමා විසින්ම පිළිපැද ඇස් පනාපිට මෙලොවදී ම ප්‍රතිඵල දැක ගත හැකි බැවින් ධර්මය

(1) අකාලික වේ.
(2) ඒහිපස්සික වේ.
(3) සන්දිට්ඨික වේ.
(4) ඕපනයිකෝ වේ.

9) තෙරුවන් ගුණ අතරින් මහා සංඝරත්නයට අයත් ගුණ ගණන

(1) 3 කි (2) 6 කි (3) 9 කි (4) 24 කි

10) පංච නීවරණ ධර්ම අතරින් කැළඹී ඇති ජලයට උපමා කර ඇති නීවරණය වන්නේ

(1) කාමච්ඡන්දය
(2) ව්‍යාපාදය
(3) ථිනමිද්ධය
(4) උද්ධච්ච කුක්කුච්චය

11) සමථ භාවනාව සඳහා වූ අරමුණු හෙවත් කර්මස්ථාන ගණන,

(1) 30 කි. (2) 40 කි. (3) 50 කි. (4) 60 කි.

12) භාවනාවට පිවිසෙන තැනැත්තා ඉටුකර ගත යුතු පූර්ව අවශ්‍යතා අතර "විනිවිද දකින නුවණ" හඳුන්වන්නේ

(1) වීර්යය යනුවෙනි.
(2) ප්‍රඥාව යනුවෙනි.
(3) සිල්වත් වීම යනුවෙනි.
(4) සන්තුට්ඨිතා යනුවෙනි.

13) සසර දුක් අතර එන "මහළුව දිරාපත් වීම" හඳුන්වා ඇත්තේ,

(1) ජාති නමිනි. (2) ජරා නමිනි. (3) ව්‍යාධි නමිනි. (4) මරණ නමිනි.

14) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු

(1) ත්‍රිවිද්‍යාවයි. (2) ත්‍රිශික්ෂාවයි. (3) ත්‍රිලක්ෂණයයි. (4) ත්‍රිවේදයයි.

15) සතර මහා භූත අතරින් උෂ්ණ සීතල ගතිය හඳුන්වන්නේ

(1) පඨවි (2) ආපෝ (3) තේජෝ (4) වායෝ

16) සසුන් කෙත සරු කළ වැලිවිට සරණංකර හිමි පැවිදි බව ලැබූ විහාරය කුමක් ද?

(1) මහනුවර සූරියගොඩ විහාරය
(2) වැලිවිට තුම්පනේ විහාරය
(3) කැළණිය නව විහාරය
(4) හිඳගල රජ මහා විහාරය

17) වැලිවිට සරණංකර හිමියන් ශාසනමාමක පිරිස සංවිධානය කර ගනිමින් ඇති කළ සංවිධානය වන්නේ

(1) මහා බෝධි සමාගමයි.
(2) සිල්වත් සමාගමයි.
(3) පරම විඥානාර්ථ සමාගමයි.
(4) බණවර සමාගමයි.

18) එළාර රජුට පෙර ලක්දිව බලය අල්ලාගෙන සිටි ආක්‍රමණිකයන් දෙදෙනා වන්නේ

(1) ගිරි හා කුම්භාණ්ඩ දෙදෙනාය.
(2) පලයමාර හා පිලයමාර දෙදෙනාය.
(3) සේන, ගුත්තික දෙදෙනාය.
(4) කාලිංස මාඝ හා නිගණ්ඨ දෙදෙනාය.

19) බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන ධම්මපදය අයත් වන සූත්‍ර පිටකයට අයත් නිකාය වන්නේ

(1) දීඝ නිකාය (2) සංයුක්ත නිකාය (3) මජ්ඣිම නිකාය (4) ඛුද්දක නිකාය

20) දුන්නෙන් විදින ලද ඊතලය වේගයෙන් ගොස් වනයේ වැටී දිරාපත්ව යන්නාක් මෙන් තරුණ වියෙහි කළ කී දෑ සිහි කරමින් සුසුම් ළෑම අර්ථවත් වන ධම්ම පද ගාථා පාඨය වන්නේ,

(1) අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං
(2) ජිණ්ණ කොඤ්චාව ඣායන්ති - ඛීණ මච්ඡේව පල්ලලේ
(3) සෙන්ති චාපාති ඛීණාව - පුරාණානි අනුත්ථුනං
(4) ඒකාහං ජීවිතං සෙය්‍යෝ - සීල වන්තස්ස ඣායිනෝ

Learning Resource Center
R
De Mazenod College
Kandana

21) පුද්ගල යසස වර්ධනයට හේතු වන කරුණක් ලෙස දක්වා ඇති "සඤ්ඤත" යන්නෙහි අර්ථය වන්නේ,

(1) පිරිසිදුව කටයුතු කිරීමයි.
(2) නුවණින් පිරික්සීමයි.
(3) මතක ශක්තියයි.
(4) දමනය වීමයි.

22) පුද්ගලයා විසින් නොකළ යුතු දේ ධර්මයෙහි හඳුන්වා ඇත්තේ,

(1) විරමණය යනුවෙනි.
(2) සමාදානය යනුවෙනි.
(3) සිරිත් යනුවෙනි.
(4) චාරිත්‍ර යනුවෙනි.

23) භෝග විනාශයට හේතුවන කරුණු 6ක් පෙන්වා දෙන සූත්‍රය වන්නේ

(1) පරාභව සූත්‍රය
(2) මහා මංගල සූත්‍රය
(3) සිගාලෝවාද සූත්‍රය
(4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

24) මරණාසන්න මොහොතේ සුගතියම දැක සිහියෙන් යුතුව කලුරිය කළ උපාසක තුමා වන්නේ

(1) අනේපිඬු සිටුතුමායි.
(2) ධම්මික උපාසකතුමායි.
(3) නකුල පිතා උපාසකතුමායි.
(4) චුල්ල කාළ උපාසකතුමායි.

25) බුදුරදුන් විසින් සිගාල සිටු පුත්‍රයාට දේශණා කරන ලද දිසා නමස්කාරයට අනුව උතුරු දිසාව නියෝජනය කරන්නේ

(1) මව්පියන්ය.
(2) ගුරුවරුන්ය.
(3) හිතමිතුරන්ය.
(4) ස්වාමි භාර්යාවන්ය.

26) සදිසා නමස්කාරයට අනුව සේවකයාගේ යුතුකමක් ලෙස දක්වා ඇත්තේ,

(1) ස්වාමියාට පසුව නිදා ගැනීම.
(2) දුටු විට හුස්නෙන් නැගිටීම.
(3) අවමන් නොකිරීම.
(4) සෞඛ්‍ය පහසුකම් සපයා දීම.

27) බුදුරජාණන් වහන්සේ තමාගේ ජීවිතය නෙළුමකට උපමා කරමින් පද්මාකාර ජීවිතය පිළිබඳව හඳුන්වා දෙනු ලැබුවේ,

(1) ද්‍රෝණ බමුණාට යි.
(2) සේල බමුණාට යි.
(3) දීඝජානු කෝලිය පුත්‍රයාට යි.
(4) සිගාලක තරුණයාට යි.

28) පද්ම උපමාවට අනුව බුදු රදුන් වදාළ ත්‍රිවිධ පුද්ගලයින් වන්නේ,

(1) සද්ධා, බුද්ධි, විතක්ක
(2) අවම, මධ්‍යම, උත්තම
(3) උගත්, නූගත්, සිල්වත්
(4) රාග, ද්වේෂ, මෝහ

29) තමා උපමා කොට වරදින් මිදීමේ ක්‍රමය හැඳින්වීමට සුදුසුම පදය වන්නේ,

(1) අත්තූපනායික ධර්ම පර්යායයි.
(2) අත්තාධිපතෙය්‍ය ධර්මය යි.
(3) ලෝකාධිපතෙය්‍ය ධර්මය යි.
(4) ධම්මාධිපතෙය්‍ය ධර්මය යි.

30) ආගමික සහජීවනය සඳහා උපයෝගී කරගත හැකි බෞද්ධ ඉගැන්වීමක් නොවන්නේ

(1) සිව් සඟරාවත
(2) පංචශීලය
(3) සිව් බඹ විහරණ
(4) දස අකුසල්

31) "අභිධ්‍යාව" හෙවත් "දැඩි ලෝභය" දස අකුසල් අතරින්

(1) කාය කම්මයට අයත් වේ.
(2) වචී කම්මයට අයත් වේ.
(3) මනෝ කම්මයට අයත් වේ.
(4) මේ කිසිවකට අයත් නොවේ.

32) කුසල මූල අතරින් **"මූලාවෙන් තොරබව"** හඳුන්වනු ලබන්නේ,

(1) අලෝභය නමිනි.
(2) අද්වේශය නමිනි.
(3) අමෝහය නමිනි.
(4) අවිද්‍යාව නමිනි.

33) වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි වඩාත් ශක්තිමත් බලසම්පන්න කුසල අකුසල කර්ම,

(1) ගරුක කර්මය නම් වේ.
(2) ආසන්න කර්මය නම් වේ.
(3) ආචින්න කර්මය නම් වේ.
(4) කටත්තා කර්මය නම් වේ.

34) ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමේ දී තමාට මුහුණ දීමට සිදුවන අකුසල කර්ම විපාක ද මඟ හරවා ගත හැකි ය. මෙම අදහස බුදු දහමේ හඳුන්වන්නේ

(1) ගති සම්පත්ති වශයෙනි.
(2) කාල සම්පත්ති වශයෙනි.
(3) ප්‍රයෝග සම්පත්ති වශයෙනි.
(4) උපධි සම්පත්ති වශයෙනි.

35) සෙව්වන්දි උදේ පාසල් යන විට ඉතා අලංකාරව විකසිත වී තිබූ රෝස මල් සවස එනවිට මුකුලිත වී තිබුණි. එය දුටු සෙව්වන්දිගේ සිතට නැගුනේ මෙලොව සියල්ල

(1) අනිත්‍යය බවයි.
(2) දුක්ඛ බවයි.
(3) අනාත්ම බවයි.
(4) අසංඛත බවයි.

36) සත්ත්වයා සකස් වී ඇති ස්කන්ධ අතරින් දිය බුබුලකට උපමා කර ඇත්තේ

(1) රූපයයි.
(2) වේදනාවයි.
(3) සඤ්ඤාවයි.
(4) සංස්කාරයි.

37) යේ ධම්මා හේතුප්පභවා.... යනා දී ගාථාව අස්සජී හිමි විසින් දේශනා කළේ කා හට ද?

(1) කෝලිය පිරිවැජියාටය.
(2) ද්‍රෝණ බමුණාටය.
(3) සංජය පිරිවැජියාටය.
(4) උපතිස්ස පිරිවැජියාටය.

38) බුදුන් වහන්සේ තම මංගල ධර්ම දේශනය පවත්වන ලද්දේ

(1) වේළුවනාරාමයේදී ය.
(2) දෙව්රම් විහාරයේදී ය.
(3) බරණැස ඉසිපතන මිගදායේදී ය.
(4) කලන්දක නිවාපයෙහිදී ය.

39) දම්සක් පැවතුම් සූත්‍රයේ පෙන්වා දෙන පරිදි සසර දුක තුන් ආකාර වේ. එම ආකාර තුනට අයත් නොවන්නේ

(1) දුක්ඛ දුක්ඛතා
(2) විපරිණාම දුක්ඛතා
(3) අසංඛාර දුක්ඛතා
(4) සංඛාර දුක්ඛතා

40) ආර්ය අෂ්ටාංගික මාර්ගාංග වලින් ප්‍රඥා ශික්ෂාවට අයත් මාර්ගාංග පමණක් දැක්වෙන වරණය තෝරන්න.

(1) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප
(2) සම්මා වාචා, සම්මා සමාධි
(3) සම්මා දිට්ඨි, සම්මා කම්මන්ත
(4) සම්මා ආජීව, සම්මා සංකප්ප

(ලකුණු 1 x 40 = 40)

REGISTRAR
De Mazenod College
Kandana.



REGISTRAR
De Mazenod College
Kandana.

2024.09

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම 2024
## බුද්ධ ධර්මය
## 10 ශ්‍රේණිය

විභාග අංකය ..................

Learning Resource Centre R De Mazenod College Kandana

පොදු උපදෙස්
- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

## II කොටස

01. i. සිදුහත් බෝසතාණන් කිං කුසල ගවේසීව සිටි කාලයේදී හමුවූ සමාපත්ති ලාභී තවුසන් දෙදෙනා නම් කරන්න.

ii. සිදුහත් කුමරු සර්ව මිත්‍ර පඬිතුමා වෙතින් උගත් ශිල්ප දෙකක් නම් කරන්න.

iii. වචනයෙන් සිදුවන වැරදි දෙකක් ලියන්න.

iv. නව අරහාදී බුදුගුණ අතරින් දෙකක් නම් කරන්න.

v. "සන්තුට්ඨිතා" යන්නෙහි අර්ථය කුමක් ද?

vi. " සමවායෝ එව සාධු" යන්නෙහි අර්ථය ලියා දක්වන්න.

vii. වැලිවිට සරණංකර හිමි විසින් රචිත ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

viii. යටිගම් බලා යාම හැරපියා උඩුගම් බලා යැමට පෙළඹවීම බුදු දහමේ කුමන නමකින් හැඳින්වේ ද?

ix. සතර සංග්‍රහ වස්තු අතරින් දෙකක් නම් කරන්න.

x. සහජීවනය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න (ලකුණු $2\times10 = 20$)

02. i. සතර පෙරනිමිති නම් කරන්න.

ii. කුමාර අවදියේදී සිදුහත් කුමරු මුහුණ දුන් අභියෝග තුනක් ගෙන හැර දක්වන්න.

iii. ශිෂ්‍ය ජීවිතයේදී ඔබ මුහුණ දෙන අභියෝග ජය ගැනීම සඳහා ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි පහදන්න. (ලකුණු 2+3+5 = 10)

03. i. මහා සංඝරත්නය සතු ගුණ දෙකක් නම් කරන්න.

ii. ඔබ විසින් ඉහත නම් කරන ලද ගුණ අතරින් එකක් හඳුන්වන්න.

iii. මහා සංඝරත්නයෙන් සිදුවන ආගමික, සමාජීය හා ජාතික සේවාවන් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 2+3+5 = 10)

**04.** **i.** සදිසා නමස්කාරය අර්ථවත් කරමින් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍ර දේශනාව නම් කරන්න.

**ii.** සදිසා නමස්කාරයේ එන සමාජීය කණ්ඩායම් තුනක් ඊට අදාළ දිශාවද සමඟ ගෙනහැර දක්වන්න.

**iii.** යුතුකම් ඉටුකිරීමෙන් පුද්ගල මෙන්ම සමාජ දියුණුවද ඇතිවන අයුරු සදිසාවට අයත් එක් සමාජ කණ්ඩායමක් ඇසුරින් පහදන්න. (ලකුණු 2+3+5 = 10)

**05.** **i.** "උට්ඨානවතෝ සතිමතෝ" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

**ii.** ඉහත ගාථාවෙහි එන පුද්ගල යසස වැඩීමට හේතුවන කරුණු අතරින් තුනක් ගෙනහැර දක්වන්න.

**iii.** ඉහත ගාථාවේ එන උපදෙස් ඔබේ ජීවිතයේ දියුණුවට අදාළ කර ගත හැක්කේ කෙසේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 2+3+5 = 10)

**06.** **i.** කර්මයේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

**ii.** විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද තුනක් ගෙනහැර දක්වන්න.

**iii.** අයහපතින් වැළකී යහපත් ක්‍රියාවල නිරත වීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

**07.** පහත මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

- **i.** දුටුගැමුණු රජතුමා
- **ii.** ත්‍රිලක්ෂණය
- **iii.** සීලයේ ආනිසංස
- **iv.** පංච නීවරණ ධර්ම

(ලකුණු 5 + 5 = 10)

REGISTRAR
De Mazenod College
Kandana.